රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි - 2000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි**

**ACL 22513 – ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**
**අපැහැදිලි අකුරුවලට ලකුණු අඩුවිය හැකිය.**

**කාලය : පැය 03 යි.**

---

01. ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා අධ්‍යයනවලට භූ කාල මානයේ (Geological Time Table) ඇති අදාළත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

02. ලිඛිත ඉතිහාසයට පෙර මානව ඉතිහාසය අධ්‍යයනයෙහිලා ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා අධ්‍යයනවල උපයෝගීතාව ප්‍රමාණ කරන්න.

(ලකුණු 15)

03. 1930 – 1969 අතර කාලයේ ශ්‍රී ලංකාවේ සිදුවූ ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා පර්යේෂණ අතර පී.ඊ.පී. දැරණියගලගේ පර්යේෂණවල සුවිශේෂී බව ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 15)

04. නිර්මාණ ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ ලෙන්ගුහා සිතුවම් ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 15)

05. "මානව විද්‍යාත්මක ලක්ෂණ අනුව ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා යුගයේ මානවයා වඩාත් සමීප වන්නේ වැදිජනතාවටය". සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

06. "මධ්‍ය ශිලා යුගයේ මානවයාගේ ජීවනෝපාය (Subsistence Pattern) පරිසරය සමඟ සෘජු සබඳතාවක් පැවැත්විය". විමසන්න.

(ලකුණු 15)

07. ශ්‍රී ලංකාවේ නවශිලා යුගය පිළිබඳ ලැබී ඇති සාධක කෑගල්ල දොරවක ලෙන, මාන්තායි වරාය හා හෝර්ටන්තැන්න පර්යේෂණ ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

08. පහත සඳහන් මාතෘකාවලින් දෙකකට (02) ප්‍රමාණවත් සටහන් ලියන්න.

i. ශ්‍රී ලංකාවේ සංස්කෘතික යුගකරණය

ii. සිරාන් දැරණියගලගේ ප්‍රාග් ඓතිහාසික පර්යේෂණ

iii. රත්නපුර පස් සැකැස්මේ (Rathnapura Formation) හමුවන ප්‍රාග් ඓතිහාසික සාධක

iv. ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා යුගයේ මෙවලම් තාක්ෂණය

(ලකුණු 7.5 × 02)

@@@@@@@@@@@@@@